# මාධ්‍ය නිවේදනය

# අයදුම්පත් කැඳවීම

**ශ්‍රී ලංකාවේ නිල නියෝජනය – අන්තර්ජාතික වෘත්තාන්ත චිත්‍රපට කාණ්ඩය**
**99 වන ඇකඩමි සම්මාන උළෙල (ඔස්කාර්), 2027**

**ශ්‍රී ලාංකේය සිනමාව ඇකඩමි සිනමා සම්මාන උළෙලෙට (ඔස්කාර්) පිවිසීමේ ඓතිහාසික අවස්ථාව**

**ශ්‍රී ලංකේය සිනමා ඉතිහාසය තුළ ප්‍රථම වරට, ජාතික චිත්‍රපට සංස්ථාවේ මැදිහත් වීමෙන් පිහිටුවන ලද හා ඇමෙරිකා එක්සත් ජනපදයේ චිත්‍රපට කලා හා විද්‍යා ඇකඩමිය (Academy of Motion Picture Arts and Sciences) විසින් අනුමැතිය ලද තේරීම් කමිටුවක් විසින් ඇකඩමි සිනමා සම්මාන උළෙලෙට (ඔස්කාර්) ඉංග්‍රීසි භාෂිත නොවන අන්තර් ජාතික දීර්ඝ වෘත්තාන්ත සිනමා සම්මානය කාණ්ඩය යටතේ, ශ්‍රී ලංකේය චිත්‍රපටයක් නිළ වශයෙන් ඉදිරිපත්කිරීමේ අවස්ථාව උදාකරගෙන ඇත.**

**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව 2027 වසරේ පැවැත්වීමට නියමිත 99 වන ඇකඩමි සම්මාන උළෙලේ (The 99th Academy Awards) අන්තර්ජාතික වෘත්තාන්ත චිත්‍රපට (International Feature Film) කාණ්ඩය නියෝජනය ඉදිරිපත් කිරීම උදෙසා ශ්‍රී ලංකාවෙන් චිත්‍රපටයක් තෝරා ගැනීම වෙනුවෙන් අයදුම්පත් කැඳවයි.**

ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව විසින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික ඔස්කාර් තේරීම් කමිටුව විසින් මෙම තේරීම් ක්‍රියාවලිය සිදුකරන අතර, ඇමෙරිකා එක්සත් ජනපදයේ චිත්‍රපට කලා හා විද්‍යා ඇකඩමිය (Academy of Motion Picture Arts and Sciences) විසින් නියම කර ඇති අදාළ නීති හා යෝග්‍යතා නිර්ණායකයන්ට අනුකූලව ශ්‍රී ලංකාව නියෝජනය කරන චිත්‍රපටය තෝරා ගැනීමට නියමිතය.

## අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබන චිත්‍රපට

1. මෙම අවස්ථාව සඳහා අයදුම් කරන චිත්‍රපටය මිනිත්තු 40කට වැඩි ධාවන කාලයක් සහිත දීර්ඝ ප්‍රබන්ධ වෘත්තාන්ත චිත්‍රපටයක් හෝ දීර්ඝ වාර්තා වෘත්තාන්ත චිත්‍රපටයක් හෝ දීර්ඝ සජීවීකරණ වෘත්තාන්ත චිත්‍රපටයක් විය යුතුය.

2. එමෙන්ම, 2025 ඔක්තෝබර් 1 සිට 2026 සැප්තැම්බර් 30 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ අවම වශයෙන් එක් සිනමාශාලාවක අඛණ්ඩව අවම වශයෙන් දින හතක්, නිෂ්පාදකයාට සහ ප්‍රදර්ශකයාට ලාභ ඉපයීමේ අරමුණින් වාණිජ පදනමින් ප්‍රදර්ශනය කර තිබීම අනිවාර්ය වේ.

3. චිත්‍රපටයේ මුල් පටිගත කළ සංවාද හඬ පටය සහ සමස්ත චිත්‍රපටයේ අන්තර්ගතය සලකා බැලීමේදී, සියයට පනහකට (50%) වැඩි ප්‍රමාණයක් ඉංග්‍රීසි නොවන භාෂාවකින් හෝ භාෂාවලින් සමන්විත විය යුතුය.

4. තවද, චිත්‍රපටයේ නිර්මාණාත්මක පාලනයේ බහුතරය ශ්‍රී ලාංකේය පුරවැසියන්, ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් හෝ ශ්‍රී ලංකාව තුළ සරණාගතභාවය හෝ නීතිමය රැකවරණය හිමි පුද්ගලයන් සතුව පවතින බව තහවුරු කළ හැකි විය යුතුය.

5. ඒ අනුව අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරුන් ශ්‍රී ලාංකේය පුරවැසියන්, ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් හෝ ශ්‍රී ලංකාව තුළ නීතිමය රැකවරණය හිමි පුද්ගලයන් විය යුතු අතර, අවම වශයෙන් එක් තිර රචකයකු ද එම සුදුසුකම් සපුරාලිය යුතුය.

6. කැමරා අධ්‍යක්ෂණය, සංස්කරණය, සංගීත අධ්‍යක්ෂණය, ශබ්ද සැලසුම්කරණය, වර්ණ සංකලනය, දෘශ්‍ය ප්‍රයෝග, නිර්මාණ සැලසුම්කරණය, කලා අධ්‍යක්ෂණය, ඇඳුම් නිර්මාණය, අංගරචනය සහ නළු නිළිවරණ අධ්‍යක්ෂණය ඇතුළු ප්‍රධාන තාක්ෂණික හා නිර්මාණාත්මක තනතුරුවල බහුතරය ද ශ්‍රී ලාංකේය පාර්ශ්වයන් විසින් දැරිය යුතුය.

7. චිත්‍රපටයේ ප්‍රධාන හා සහාය චරිත බහුතරය ශ්‍රී ලාංකේය පුරවැසියන්, ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් හෝ ශ්‍රී ලංකාව තුළ නීතිමය රැකවරණය හිමි පුද්ගලයන් විසින් නිරූපණය කර තිබීම ද අවශ්‍ය වේ.

8. මීට අමතරව, චිත්‍රපටයේ මූල්‍ය හිමිකමේ බහුතරය ශ්‍රී ලාංකේය පුරවැසියන්, ශ්‍රී ලංකාවේ පදිංචිකරුවන් හෝ ශ්‍රී ලංකාව තුළ නීතිමය රැකවරණය හිමි පුද්ගලයන් හෝ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද සමාගමක් හෝ ව්‍යාපාරයක් සතුව තිබිය යුතුය.

## තේරීම් ක්‍රියාවලිය

අදාළ යෝග්‍යතා නිර්ණායක සපුරාලන සියලුම චිත්‍රපට ජාතික ඔස්කාර් තේරීම් කමිටුව විසින් නැරඹීමෙන් හා සලකා බැලීමෙන් අනතුරුව ඡන්ද විමසීමක් මගින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීමට වඩාත් සුදුසු චිත්‍රපටය තෝරා ගැනීමට නියමිතය.

## අයදුම්පත් භාරගැනීම

- ☞ නිල අයදුම්පත්‍රය, ඉදිරිපත් කළ යුතු ලේඛන සහ අනෙකුත් අවශ්‍යතා පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන **www.nfc.gov.lk** ඔස්සේ ලබාගත හැකිය.
- ☞ අයදුම්පත් **2026** අගෝස්තු **24** පෙරවරු **9.00** සිට **2026** සැප්තැම්බර් **21** පස්වරු **4.00** දක්වා භාරගැනීමට නියමිතය.

## අයදුම්පත් යොමුකිරීම

- ☞ නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය සහ අදාළ සියලුම ලේඛන **office.noscsl@gmail.com** විද්‍යුත් තැපැල් ලිපින වෙත යොමු කළ යුත අතර, **admin.noscsl@nfc.gov.lk / chairperson.noscsl@gmail.com** විද්‍යුත් තැපැල් ලිපින වෙත ද යොමු කළ යුතුය.

**තෝරාගනු ලබන චිත්‍රපටය 2026 සැප්තැම්බර් 28 වැනිදා (NOSCSL) නිල වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.**

## විමසීම


**සභාපති**
**ශ්‍රී ලංකා ජාතික ඔස්කාර් තේරීම් කමිටුව (NOSCSL)**
**ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව (NFC)**
අංක 303, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07, ශ්‍රී ලංකාව
**දුරකථන:** 0112590761

**විද්‍යුත් තැපැල:**
**office.noscsl@gmail.com**
**admin.noscsl@nfc.gov.lk**
**chairperson.noscsl@gmail.com**


ජාත්‍යන්තර සිනමා ක්ෂේත්‍රයේ ඉහළම පිළිගැනීමක් ලෙස සැලකෙන ඇකඩමි සිනමා සම්මාන උළෙලේ (ඔස්කාර්) **ඉංග්‍රීසි භාෂිත නොවන අන්තර් ජාතික දීර්ඝ වෘත්තාන්ත සිනමා සම්මානය** කාණ්ඩය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරන චිත්‍රපටයක් විධිමත් ජාතික තේරීම් ක්‍රියාවලියක් ඔස්සේ තෝරා ගැනීම, ලාංකේය සිනමාවේ ජාත්‍යන්තර ප්‍රවේශය තවදුරටත් පුළුල් කිරීමට වැදගත් පියවරක් වනු ඇත.